# ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථාන
# 23 වන සංවත්සරය 2013

# සමරු දේශනය



## ජාතික සංවර්ධනයේදී ජාතික පුස්තකාලයේ දායකත්ව


## මහාචාර්ය පියදාස රණසිංහ මහතා


## 2013.04.23


ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

# ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය
# (ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය)

## 23 වන සංවත්සරය - 2013

## සමරු දේශනය

## ජාතික සංවර්ධනයෙහි ලා ජාතික පුස්තකාලයේ දායකත්වය


මහාචාර්ය පියදාස රණසිංහ මහතා
පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය


2013 04 23

# ජාතික සංවර්ධනයෙහි ලා ජාතික පුස්තකාලයේ දායකත්වය

පදගතාර්ථ වශයෙන් සලකන කල්හි සංවර්ධනය යනු මනා හෙවත් යහපත් වැඩි දියුණුවයි. දළ ජාතික නිෂ්පාදිතයේ වෘද්ධිය සංවර්ධනය ලෙස අතීතයේ දී සලකනු ලැබුව ද අද ඒ මතය වෙනස් වී තිබේ. ජාතික සංවර්ධනය යනු ජාතික අනන්‍යතාව ගොඩ නැංවීමේ ක්‍රියාවලියේ දී සිදුවන සමාජ දේශපාලනික හා ආර්ථික සංවර්ධනය හා බැඳුණක් බව ඇතැමුන්ගේ මතය යි. පෘථුලාර්ථයෙන් සලකා බලන කල්හි සංවර්ධනය යනු ආර්ථික වෘද්ධිය ඉක්මවා යන සංකල්පයක් බව පැහැදිලි ය. ලෝක බැංකු මතය අනුව ජාතික සංවර්ධනයේ අවසන් ඉලක්කය මානව සංවර්ධනය යි. හෙවත් මිනිසාගේ වැඩි දියුණුව යි. සැබෑ මානව සංවර්ධනයක් සිදු වන්නට නම් ආර්ථික වෘද්ධිය පමණක් නොසෑහේ. දුරාතීතයෙන් මෙන් ම සමීපාතීතයෙන් ද උපුටා දැක්විය හැකි නිදසුන් වලින් පෙනී යන්නේ රටක් ආර්ථික වශයෙන් සංවර්ධනය වූවත් සම්පත් බෙදී යාමේ විෂමතා, ආර්ථික වෘද්ධිය ළඟා කර ගැනීම උදෙසා සාහසික අයුරින් ස්වාභාවික සම්පත් උපයෝජනය, මානව නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය නොසලකා හැරීම ආදී විවිධ හේතු නිසා අපේක්ෂිත මානව සංවර්ධනයක් සිදු නොවන බවයි. ජාතික සංවර්ධනය අර්ථවත් වන්නේ ආර්ථික වෘද්ධියේ ප්‍රතිලාභ බුද්ධිමත්ව භුක්ති විඳිය හැකි ජන සමූහයක් අතර පමණි.

බෞද්ධ දර්ශනය අනුව සලකා බලන විට මානව සංවර්ධනය භෞතික සංවර්ධනය හා අධ්‍යාත්මික සංවර්ධනය යන අන්‍යෝන්‍ය ප්‍රතිබද්ධ සංඝටක දෙකකින් සමන්විත ය. යහපත් මානව සංවර්ධනයක් හට ගන්නේ මේ දෙපක්ෂය ම සමතුලිත ආකාරයෙන් පවත්නේ නම් පමණි. එබඳු සමතුලිතතාවක් පරමාදර්ශී සංකල්පයක් වෙතත් අඩු වැඩි වශයෙන් මේ දෙපක්ෂයේ ම සංවර්ධනයක් අවශ්‍ය ය. සැබෑ ජාතික සංවර්ධනයක් අපේක්ෂා කළ හැකි වන්නේ එවිට ය.

යහපත් ජාතික සංවර්ධනයක් පවත්නා කල්හි ජනතාවගේ ජීවන තත්ත්වය හැම අතින් ම ඉහළ යා යුතු ය. මේ අනුව ගුණාත්මක අධ්‍යාපනය, පූර්ණ සේවා නියුක්තිය, ආහාර පාන සුලභතාව, පිරිසිදු පානීය ජලය, සෞඛ්‍ය පහසුකම්, අපරාධ අවම වීම, ජන කොටස් අතර සාමය හා සහජීවනය, සමාජ සදාචාරය, සංස්කෘතික අනන්‍යතා පෝෂණය ආදී යහපත් ලක්ෂණ ජාතික සංවර්ධනය හා අවියෝජනීය ලෙස බැඳී පවතී. අධ්‍යාත්මික - භෞතික යන දෙපක්ෂයේ ම සම්මිශ්‍රණයක් සේ සැලකිය හැක්කේ එබඳු ජාතික සංවර්ධනයකි.

ජාතික සංවර්ධනය හුදෙක් මූල්‍ය සාධකය මත පමණක් රඳා පවතින්නේ ය යන්න මතිභ්‍රමයකි. සංවර්ධනයට මුදල් අවශ්‍ය බව සැබෑ වූවත් මුදලින් වැඩ ගැනීමට දැනුම අවශ්‍ය ය. සැලසුම් ක්‍රියාත්මක කරන්නවුන්ගේ පාර්ශ්වයෙන් මෙන් ම ජනතාවගේ පාර්ශ්වයෙන් ද දැනුම අත්‍යවශ්‍ය සාධකයකි. කවර තරමේ සංවර්ධන ව්‍යාපෘතියක් වූව සාර්ථක වන්නේ දැනුවත් ජන සමාජයක් අතර පමණි. මේ සඳහා කොතෙකුත් නිදර්ශන ශ්‍රී ලංකාවෙන් ම එළවිය හැකි ය. නිදහස ලබා හැට පස් වසරක් ගත වීමෙන් පසුව වූවත් ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධනය ගැන සතුටු විය හැකි තත්ත්වයකට අප තාමත් පැමිණ නැත. ඊට ප්‍රධානතම හේතුව ජනතාවගේ දැනුවත් බව පිළිබඳ ගැටලුව යි.

ජනතාවට දැනුම ලබා දෙන මාර්ග කීපයක් තිබේ. අධ්‍යාපනය, පුස්තකාල සේවා හා ජන මාධ්‍ය ඒ අතර ප්‍රමුඛත්වය ගනී. පාසල් අධ්‍යාපනයෙන් සාක්ෂරතාව ඇතුළු මූලික ජීවන කුසලතා ලද හැකි වූවත් යාව ජීව අධ්‍යාපනයකට මඟ පාදන්නේ පුස්තකාල සේවාවන් ය. ජන මාධ්‍ය සේවාවන් නිසි ලෙස ක්‍රියාත්මක වීම සඳහා ද පුස්තකාලවල සහාය අත්‍යවශ්‍ය ය.

ජාතික සංවර්ධනය විෂයයෙහි ජාතික පුස්තකාලයේ දායකත්වය වැදගත් වන්නේ යථෝක්ත සන්දර්භය තුළ ය. රටක පුස්තකාල සේවාවේ නියමුවා ජාතික පුස්තකාලය වශයෙන් සැලකීමේ වරදක් නැත. පුස්තකාල සම්පත් එකතුව අතින් පමණක් නොව ආයතනයක් වශයෙන් ඊට හිමිව ඇති නෛතික බලතල අනුව ද ජාතික පුස්තකාලය ජාතික සංවර්ධනයට සෘජුව දායක වේ. ඥානය මූල්‍ය ප්‍රාග්ධනය අභිබවා යන ප්‍රග්ධනයක් බවට පත් කිරීමේ ශක්තිය ජාතික පුස්තකාලයක් සතුව පවතී.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය නිල වශයෙන් විවෘත කරනු ලැබුවේ වර්ෂ 1990 දී වුවත් ජාතික පුස්තකාල සංකල්පය ඊට බොහෝ කලකට පෙර පටන් ම මෙරට තහවුරු වී තිබිණි. එම නමින් නොහැඳින්වුණු නමුදු මෙරට රජ මාළිගාවල රාජ්‍ය පුස්තකාල/ලේඛනාගාර තිබූ බව ඓතිහාසික මූලාශ්‍ර වලින් සනාථ වේ. රාජානුග්‍රහය යටතේ රටෙහි විවිධ තන්හි පුස්තකාල පිහිටුවා තිබූ බවට ද තොරතුරු ලැබේ. ජාතික සංවර්ධනය ඉහළ ම මට්ටමක තිබූ අවධිවල පුස්තකාල විශාල සංඛ්‍යාවක් රට තුළ ස්ථාපනය කර තිබූ බව නිරීක්ෂණය කළ හැකි ය. මෙයින් පෙනී යන්නේ අතීතයේ දී පවා පුස්තකාල සේවාව ජාතික සංවර්ධනයේ අවශ්‍යම අංගයක් සේ සලකන ලද බව යි. කෝට්ටේ රාජ්‍ය යුගයෙන් පසු බිඳ වැටුණු මෙරට පුස්තකාල සේවාව ගැන නැවත යම් අවධානයක් යොමු වන්නට පටන් ගන්නේ 19 සියවස අගභාගයේ දී පමණ බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන සමයේ දී ය. වර්ෂ 1870 දී පිහිටුවන ලද කොළඹ කෞතුකාගාර පුස්තකාලය 1990 දී ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය නිල වශයෙන් විවෘත කැරෙන තුරු මෙරට ජාතික පුස්තකාලය වශයෙන් ක්‍රියාත්මක වූ බව සඳහන් කළ යුතු ය. රාජ්‍ය ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව සතු නීතිමය තැන්පතු එකතුව ද මෙහි ලා ඉටු කරන ලද්දේ වැදගත් සේවාවකි. ජාතික පුස්තකාලයක් විසින් ඉටු කළ යුතු ප්‍රමුඛ මෙහෙවරක් වූ ජාතික ග්‍රන්ථනාමාවලී සම්පාදනය 1960-1970 දශකය තුළ ඉටු කරන ලද්දේ ද රාජ්‍ය ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව විසින් බව මෙහි ලා වෙසෙසින් දැක්විය යුතු ය.

වර්තමාන ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ දැක්ම වන්නේ සියලු දෙනාට පුස්තකාල හා තොරතුරු සේවා සපයන ජාතික ඥාන කේන්ද්‍රය බවට පත් වීම ය. එහි මෙහෙවර ලෙස දක්වා ඇත්තේ ජාතියේ බුද්ධිමය උරුමය සුරැකීම මඟින් දැනුම් සමාජයක් බිහි කිරීම යි. ජාතික පුස්තකාල හා තොරතුරු පද්ධතියක් සංවර්ධනය කිරීම කාර්යක්ෂම පුස්තකාල සේවාවක් සඳහා තොරතුරු හා සංනිවේදන තාක්ෂණ භාවිතය දිරි ගැන්වීම, ග්‍රන්ථ විඥාපන සේවා සැපයීම හා ග්‍රන්ථ ප්‍රකාශනයට සහාය වීම ද ඊට අයත් වේ.

ජාතික පුස්තකාලය ජාතික සංවර්ධනයට දායක වන්නේ කෙසේ ද යන්න විමසා බැලිය යුත්තේ ඉන් ඉටු කැරෙන කාර්යයන් අනුව ය. 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනත අනුව ජාතික පුස්තකාලයේ ප්‍රධාන කාර්යයන් සැකෙවින් මෙසේ ය.

1 සියලු ම ජන කොටස්වල තොරතුරු අවශ්‍යතාවලට ගැලපෙන පරිදි පුස්තකාල සම්පත් පිළිබඳ ජාතික එකතුවක් පවත්වා ගෙන යාම.

2 ශ්‍රී ලංකාවේ ප්‍රකාශිත හෝ ශ්‍රී ලංකාවට අදාළ පුස්තකාල සම්පත් පිළිබඳ ජාතික එකතුවක් පිහිටුවා නඩත්තු කිරීම මඟින් ජාතික හා සංස්කෘතික උරුමය සුරැකීම.

3 මුද්‍රණකරුවන්ගේ හා ප්‍රකාශකයන්ගේ ආඥාපනත යටතේ රාජ්‍ය ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවට ලැබෙන ප්‍රකාශන අයත් කර ගැනීම.

4 මෙරට ප්‍රකාශිත හෝ මෙරටට අදාළව වෙනත් රටවල ප්‍රකාශිත හෝ මෙරට අවශ්‍යතාවන්ට ගැළපෙන විදේශීය ප්‍රකාශන මිලදී ගැනීම හෝ වෙනත් මාර්ගවලින් ලබා ගැනීම.

5 ජාතික ග්‍රන්ථ විඥාපන සේවා සැපයීම හා ජාතික ඒකාබද්ධ සූචියක් සම්පාදනය කිරීම.

6 ශ්‍රී ලංකාවේ ප්‍රකාශිත හෝ ශ්‍රී ලංකාවට අදාළ විදේශීය ප්‍රකාශන පිළිබඳ ජාතික ග්‍රන්ථ විඥාපන දත්ත පදනමක් පිහිටුවීම.

7 ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථනාමාවලිය ප්‍රකාශයට පත් කිරීම.

8 ශ්‍රී ලංකාවේ සියලු ජන කොටස්වලට අවශ්‍ය විමර්ශන සේවා, පිටපත්කරණ සේවා ප්‍රලේඛන හා පර්යේෂණ සේවා සැපයීම

9 ජාතික වශයෙන් වැදගත් දේශීය හා විදේශීය පුස්තකාල සම්පත්වලට ප්‍රවේශය සැපයීම.

10 පුස්තකාල ජාල පිහිටුවීම, ප්‍රවර්ධනය හා උපදෙස් දීම

11 පුස්තකාල සම්පත් හුවමාරු අන්තර් පුස්තකාල බැහැර දීම් කටයුතු, ලේඛන පිටපත් කිරීම, කාර්යය මණ්ඩල පුහුණුව හා පුස්තකාල සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම.

12 මෙරට පුස්තකාලවලට නව තොරතුරු තාක්ෂණය හඳුන්වාදීම හා ඒවායේ කාර්යක්ෂම භාවිතයට ඉඩ සැලසීම, ජාතික මට්ටමින් තොරතුරු තාක්ෂණ සේවා ප්‍රවර්ධනය

මේ කාර්යයන් සියල්ල තව දුරටත් සංක්ෂිප්ත කර දක්වන්නේ නම් ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයෙන් ඉටුවන මූලික මෙහෙවර මෙසේ කොටස් කළ හැකි ය.

1 ජාතික මට්ටමේ පුස්තකාල සම්පත් එකතුවක් පවත්වාගෙන යාම හා ඊට අදාළ කටයුතු කිරීම.

2 නීතිමය තැන්පතු ප්‍රතිග්‍රාහක පුස්තකාලයක් සේ කටයුතු කිරීම.

3 ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථනාමාවලිය ඇතුළු ග්‍රන්ථ විඥාපන සේවා සැපයීම

4 රටෙහි අනෙකුත් පුස්තකාලවලට නායකත්වය සැපයීම

මේ කරුණු ජාතික සංවර්ධනයට දායක වන්නේ කෙසේ ද? ජාතික මට්ටමේ පුස්තකාල සම්පත් එකතුවක් පවත්වා ගෙන යාම පිළිබඳව මුලින් ම සලකා බලමු. ජාතික පුස්තකාල සම්පත් එකතුවක් මූලික වශයෙන් කොටස් තුනකින් සමන්විත ය.

1 රට තුළ පළ වන සියලු ම ප්‍රකාශන (මුද්‍රිත හා වෙනත් මාධ්‍ය) හෙවත් ජාතික ඥාන නිෂ්පාදිත ය.

2 රටට අදාළ ව වෙනත් රටවල ප්‍රකාශයට පත් කැරෙන දෑ

3 රටට පොදුවේ වැදගත් වන හෝ වැදගත් විය හැකි වෙනත් රටවල පළ වන ප්‍රකාශන

ජාතික පුස්තකාලයක සම්පත් එකතුව අනෙකුත් පුස්තකාලවල එකතුවලට වඩා විශේෂත්වයක් උසුලන්නේ එහි පවත්නා මෙකී පූර්ණත්වය නිසා ය.

ජාතියේ සියලු ජන කොටස්වලට තොරතුරු සැපයීම එම එකතුවේ අරමුණ යි. පොදුවේ ජනතාවගේ ඥාන සමෘද්ධිය සඳහා ද සැලසුම්කරණ හා පර්යේෂණ කටයුතු සඳහා ද තොරතුරු අවශ්‍ය ය. වෙනත් පුස්තකාලවලින් ලබාගත නොහැකි තොරතුරු එකතුවේ පූර්ණත්වය නිසා ජාතික පුස්තකාලයෙන් ලබා ගත හැකි ය. එහෙයින් මෙය ජාතික සංවර්ධන තොරතුරු මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කරයි. එබඳු පූර්ණ එකතුවක් ගොඩ නැංවීම ලඝු කොට සැලකිය යුතු කරුණක් නොවේ. එය මනා අධීක්ෂණයක් යටතේ සිදු කළ යුතු බැරෑරුම් කාර්යයකි. සාර්ථක ජාතික පුස්තකාල එකතුවක් රටෙහි අනෙකුත් පුස්තකාල එකතුවල ඌනතා පූර්ණය කරයි. යම් හෙයකින් කිසියම් උපයෝජකයකුට අවශ්‍ය තොරතුරු සැපයීමට අදාළ මූලාශ්‍රය තමා සතු නොවේ නම් එම උපයෝජකයා එකී තොරතුරු ලබා ගත හැකි වෙනත් ස්ථාන කරා යොමු කිරීම ද ජාතික පුස්තකාලය මඟින් සිදු කරනු ලබයි. මෙ නයින් ජනතාවට ඥානාලෝකය ලබාදීමට ජාතික පුස්තකාලය හැම විට ම උත්සුක වෙයි. මෙහි අවසන් ඵලය වන්නේ ඥානය ජාතික සංවර්ධනයේ මූලික ප්‍රාග්ධනය බවට පත් කිරීම යි.

ප්‍රලේඛන

ජාතික පුස්තකාලය ජාතියේ ඥාන කෝෂ්ඨාගාරය ලෙස හඳුන්වනු ලබන්නේ සමස්ත ජාතියේ ම ඥාන නිෂ්පාදිතය එහි තැන්පත් වන බැවිනි. වර්ෂ 1885 සටන් මෙරට පළ වන ග්‍රන්ථ නීතිමය තැන්පතුවක් ලෙස රාජ්‍ය ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව ඇතුළු ස්ථාන කීපයක තැන්පත් කැරිණි. ජාතික කෞතුකාගාර පුස්තකාලය බ්‍රිතාන්‍ය කෞතුකාගාර පුස්තකාලය පේරාදෙණිය විශ්වවිද්‍යාල පුස්තකාලය හා ජාතික පුස්තකාලය යනු ඒ ස්ථානයි. මේ ස්ථාන අතුරින් නීතිමය තැන්පතුව නිදහසේ විවෘතව පරිහරණය සඳහා අවකාශය සලසා දෙන එක ම ස්ථානය වන්නේ ජාතික පුස්තකාලය යි. අනෙකුත් එකතුවලින් ජාතියේ මතකය සුරැකුණ ද එය භාවිතයට ගැනීමේ පහසුව සැලසෙන්නේ ජාතික පුස්තකාලයේ දී ය. මේ අනුව රටෙහි ජතික ඥානය රට වැසියන් අතර බෙදා හරින්නට උපකාරවන බැවින් ජාතික පුස්තකාලය සෘජුව ම ජාතික සංවර්ධනයට දායක වේ. නීතිමය තැන්පතුව යටතේ ලබා ගන්නා ප්‍රකාශනවලට අතිරේකව රටෙහි පළ වන විවිධ ප්‍රකාශන මිල දී ගැනීම මගින් ද ජාතික පුස්තකාල එකතුව පෝෂණය වේ. එහෙයින් ඒ එකතුව ජාතික ඥාන නිෂ්පාදිතයේ සැබෑ පිළිබිඹුවක් වන්නේ ය. රටක බුද්ධි ප්‍රභාව ප්‍රමාණ කරන්නෙකුට ඒ සඳහා සුදුසු ම ස්ථානය ජාතික පුස්තකාලය වන්නේ මේ නිසා ය.

අනෙක් කිසිදු පුස්තකාලයකින් ඉටු නො කැරෙන ජාතික සංවර්ධනය විෂයයෙහි ලා අත්‍යවශ්‍ය සේවාවක් ජාතික පුස්තකාලය මගින් ඉටු කරනු ලබයි. එනම් ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය ඇතුළු වෙනත් ග්‍රන්ථ විඥාපන සේවාවන් ය. ග්‍රන්ථ විඥාපනය යනු ප්‍රකාශිත දැනුම් වාර්තා පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු එනම් - කර්තෘ, ග්‍රන්ථනාම, විෂය, ප්‍රකාශන විස්තර, පිටු විස්තර ආදී තොරතුරු ජාත්‍යන්තර වශයෙන් පිළිගත් විධික්‍රම අනුව පෙළගස්වා උපයෝජකයන්ගේ ප්‍රයෝජනය පිණිස සංවිධානය කොට ඉදිරිපත් කිරීම යි. වඩාත් සරල ආකාරයකින් දක්වන්නේ නම් පාඨකයන් හා පත පොත මුණ ගැස්වීමේ ක්‍රියාවලිය යි. ඥාන නිෂ්පාදනය ඒක ස්ථානික, ඒක භාෂාමය හෝ ඒක මාධ්‍ය ක්‍රියාවක් නොවේ. රටෙහි විවිධ ස්ථානවල (ලෝකයේ විවිධ රටවල විවිධ ස්ථානවල) විවිධ භාෂාවලින් විවිධ මාධ්‍යවලින් ඥාන නිෂ්පාදනය සිදු වේ. එනම් ග්‍රන්ථ ප්‍රකාශයට පත් වේ. එය අවිධිමත් ක්‍රියාවලියකි. අපාලිත ක්‍රියාවලියකි. එහෙයින් ම ප්‍රකාශිත ග්‍රන්ථ කවරේ දැයි දැන ගැනීම නෛසර්ගිකව ම අපහසු කරුණක් බවට පත් වේ. සමකාලීන ග්‍රන්ථවලටත් වඩා අතීත කාලීන ග්‍රන්ථ පිළිබඳ තොරතුරු ලබා ගැනීම අතිශයින් දුෂ්කර වේ.

මේ දුෂ්කරතාව මගහරවා ලමින් සමකාලීනව මෙන් ම අතීත කාලීනව ද ප්‍රකාශිත ග්‍රන්ථ හා ලිපි ලේඛන පිළිබඳ තොරතුරු උපයෝජකයන් වෙත ගෙන එනු ලබන්නේ ජාතික පුස්තකාලය මගින් ඉටු කරනු ලබන ග්‍රන්ථ විඥාපන ක්‍රියාවලිය මගිනි. එකී ග්‍රන්ථ විඥාපන කටයුතු අතර ප්‍රමුඛස්ථානය හිමි කර ගන්නේ ජාතික ග්‍රන්ථ නාමාවලිය යි. සමකාලීනව ශ්‍රී ලංකාවෙහි පළවන ප්‍රකාශන පිළිබඳව දැන ගැනීමට ඇති එකම හා හොඳම මූලාශ්‍රය වන්නේ මාසිකව පළකරනු ලබන ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය යි. අතීතකාලීන ජාතික ඥාන නිෂ්පාදිතය වෙත පිවිසීමට ඇති එක ම දොරටුව වන්නේ අතීත කාලීන ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය යි. මේ හැරෙන්නට ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය විසින් පළ කරනු ලබන වාර සඟරා ලිපි අනුක්‍රමනිකාව පුවත් පත් ලිපි අනුක්‍රමණිකාව ආදී ප්‍රකාශන ද ප්‍රබල ජාතික ග්‍රන්ථ විඥාපන මෙවලම් වශයෙන් හැඳින්විය හැකිය. ග්‍රන්ථ විඥාපන පාලනය යනුවෙන් හැඳින්වෙන මේ ක්‍රියාවලිය මානව ප්‍රගමනය සඳහා අත්‍යවශ්‍ය සාධකයකි. එබඳු වැඩ පිළිවෙළක් නො වන්නේ නම් කිසිවකුට තමාට අවශ්‍ය ප්‍රකාශන කවරේ දැ යි සොයා ගත නො හැකි වනු ඇත. විශේෂයෙන් ම මානව ප්‍රගතිය උදෙසා කරනු ලබන විවිධාකාර අධ්‍යයන හා පර්යේෂණවලදී අවශ්‍ය ඥාන ගවේෂණ කාර්යය සඳහා ජාතික ග්‍රන්ථ විඥාපන සේවාවන් හි දායකත්වය අනිවාර්ය වේ.

ජාතික ඒකාබද්ධ සූචියක් බිහි කොට පවත්වාගෙන යාම ද ග්‍රන්ථ විඥාපන සේවා යටතේ ඉටු වන තවත් වැදගත් මෙහෙවරකි. රටෙහි ප්‍රධාන පුස්තකාල සියල්ලේ ම පාහේ ඇතුළත් පුස්තකාල සම්පත් පිළිබඳ තොරතුරු ජාතික ඒකාබද්ධ සූචියෙහි අන්තර්ගත වේ. මේ නිසා ඒ ඒ පුස්තකාල වෙත වෙන වෙන ම නො පිවිසී ජාතික ඒකාබද්ධ සූචිය භාවිතයෙන් තමනට අවශ්‍ය ග්‍රන්ථ රටෙහි කුමන පුස්තකාලයක තිබේ ද යන්න ඉක්මනින් දැන ගැනීමේ හැකියාව උපයෝජකයාට ලැබේ. එසේ තමාට ලබා ගත යුතු කිසියම් ප්‍රකාශනයක් වේ නම් එය ජාතික පුස්තකාලයෙන් ක්‍රියාත්මක වන අන්තර් පුස්තකාලීය පිරුළු සේවාව යටතේ ලබා ගැනීමට ද උපයෝජකයාට අවකාශය සැලසෙනු ඇත.

රටක ජනතාවගේ බුද්ධිමය සංවර්ධනය උදෙසා මේ සේවාවන්ගෙන් ඉටු වන මෙහෙය සම්මත දර්ශකවලින් මිනීම දුෂ්කර විය හැකි ය. එය මිනිය යුත්තේ දීර්ඝකාලීනව ලැබෙන සමාජමය ප්‍රතිලාභ අනුව ය.

රටෙහි අනෙකුත් පුස්තකාලවලට නායකත්වය සැපයීම මඟින් ද ජාතික පුස්තකාලය ජාතික සංවර්ධනයට දායක වේ. රටක විවිධ වර්ගයේ පුස්තකාල පවතී. මහජන පුස්තකාල පාසල් පුස්තකාල, ශාස්ත්‍රීය පුස්තකාල, පර්යේෂණ පුස්තකාල, රාජ්‍ය දෙපාර්තමේන්තු පුස්තකාල ආදී වශයෙනි. මේ සියලුම පුස්තකාලවලට නායකත්වය සැපයීම ජාතික පුස්තකාලයෙන් අපේක්ෂිත කාර්යයකි. මේ සඳහා ජාතික පුස්තකාලය විසින් විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරයි. ඒ අතර

1 විවිධ පුස්හකාලවලට අවශ්‍ය ප්‍රමිති සම්පාදනය

2 ග්‍රන්ථ විඥාපන කටයුතු පහසුකරලීම සඳහා පුද්ගල නාම, ග්‍රන්ථ නාම, ආයතන නාම, විෂය ශීර්ෂ ආදී සාධිකාරී ලැයිස්තු සම්පාදනය

3 උපදේශන සේවා සැපයීම

4 කාර්යය මණ්ඩල පුහුණු කිරීම්වලට දායක වීම

5 විවිධ වැඩමුළු හා සම්මන්ත්‍රණ පැවැත්වීම

6 පුස්තකාල ජාල පද්ධති ඇති කිරීම

7 පුස්තකාල සහයෝගීතාව ප්‍රවර්ධනයේ ලා මූලික ව කටයුතු කිරීම

8 නව තොරතුරු තාක්ෂණ ක්‍රමවේද හඳුන්වාදීම ඒ සඳහා දිරි දීම

ආදී කරුණු වැදගත් වේ. කේවල ආයතනයක් වශයෙන් රටෙහි සියලු ජන කොටස් වෙත දැනුම ගෙන යාම ජාතික පුස්තකාලයට කළ නොහැකි ය. ඒ සඳහා රට පුරා විසිරී පවත්නා මෙකී විවිධ පුස්තකාලවල සහාය අවශ්‍ය ය. ජාතික පුස්තකාල හා විඥාපන සේවා ප්‍රතිපත්තියක් සම්පාදනය කොට ජාල ගත පුස්තකාල සේවාවක් බිහි කරමින් ඊට නායකත්වය සැපයීම සිදු කළ හැක්කේ ජාතික පුස්තකාලයට ය. ජනතාව වෙත දැනුම ගෙන යා හැක්කේ එබඳු ක්‍රමවේදයක් ඔස්සේ ය. ජාතික සංවර්ධනයට පහසුකම් සැලසීම පමණක් නොව ජාතික සංවර්ධනය අර්ථවත් කිරීම සඳහා ද අවශ්‍ය බුද්ධිමය ප්‍රාග්ධනය සංවර්ධනය කිරීමේ මූලික වගකීම ජාතික පුස්තකාලය සතු වන බව අවසන් වශයෙන් සඳහන් කරනු කැමැත්තෙමි.

මහාචාර්ය පියදාස රණසිංහ
පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය
2013 අප්‍රියෙල් 23 ජාතික පුස්තකාල සමරු දේශනය

National Digitization Project

*National Science Foundation*

Institute : National Library and Documentation Services Board

1. Place of Scanning : National Library and Documentation Services Board, Colombo 07
2. Date Scanned : 2017/10/13
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : N.P.R. Gamage

Signature : 

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Library Documentation Officer

Name : Iromi Wijesundara

Signature : 

Date : 2017/10/13

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*